# දේශීය ආදායම් දෙපාර්තමේන්තුව
## உள்நாட்டு இறைவரித் திணைக்களம்
## DEPARTMENT OF INLAND REVENUE

ලේකම්අංශය
14 වනමහල
දේශීයආදායම්ගොඩනැගිල්ල
ශ්‍රීමත්චිත්තම්පලම්ඒගාඩිනර්මාවත
තැ.පෙ. 515, කොළඹ2- ශ්‍රී ලංකාව

செயலகம்
14 வது மாடி
உள்நாட்டு இறைவரிக் கட்டிடம்
சேர் சிற்றம்பலம் ஏ காடினர் மாவத்தை
த.பெ.இல. 515, கொழும்பு -2, இலங்கை

Secretariat
14th Floor
Inland Revenue Building
Sir Chittampalam A Gardiner Mawatha
P.O. 515, Colombo 2 - Sri Lanka

ෆැක්ස් / பக்ஸ் / Fax: 011-2338574/ 2338659/ 2338635/ 2338570/ 2338543

தொலைபேசி / Telephone: 011- 2135402/ 2135410/ 2135412 / 2135413/ 20135411

E-Mail – secretariat@ird.gov.lk
Web: www.ird.gov.lk


චක්‍රලේඛ අංකය: SEC/2021/03 2021 ජුනි 28

**හෝටල් කර්මාන්තය සඳහා එකතු කළ අගය මත බද්ද (VAT) ආපසු ගෙවීම සඳහා මාර්ගෝපදේශ**

2020 පෙබරවාරි 06 වන දින පාර්ලිමේන්තුවේදී සම්මත කරන ලද, 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 2අ වගන්තිය යටතේ ප්‍රකාශයට පත් කරන ලද 2019 නොවැම්බර් 29 දිනැති අංක 2151/52 සහ 2019 දෙසැම්බර් 06 දිනැති අංක 2152/60 දරන අතිවිශේෂ ගැසට් නිවේදනවලට සමගාමීව 2019.12.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි හෝටල් කර්මාන්තය සඳහා එකතු කළ අගය මත බද්ද (VAT) ආපසු ගෙවීමේ ක්‍රියා පරිපාටිය සරල කිරීම මෙම මාර්ගෝපදේශ තුළින් බලාපොරොත්තු වේ.

2019 දෙසැම්බර් 01 වනදා සිට ක්‍රියාත්මක වන පරිදි, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය (SLTDA) සමග ලියාපදිංචි වී ඇති හෝටලයක්, අමුත්තන්ගේ ගෘහයක්, ආපනශාලාවක් මගින් සපයන සේවාවන් හෝ ඒ හා සමාන සේවාවන් සපයන වෙනත් සමාන ව්‍යාපාරවල, යෙදවුම්වල මුළු වටිනාකමින් සියයට හැටක් (60%) **දේශීය සැපයුම්/මූලාශ්‍ර වලින් ප්‍රභවය වන්නේ නම්** එකතු කළ අගය මත බදු අනුප්‍රමාණය ශුන්‍ය (0%) වේ.

"**දේශීය සැපයුම්/ප්‍රභවයන්ගෙන් ප්‍රභවය වූ යෙදවුම්**" වල මුළු වටිනාකම යන්නෙන් පහත දැක්වෙන ආකාරයට අර්ථ නිරූපණය කර ඇත.

(i) "මුළු යෙදවුම් වටිනාකම" යන්නෙන් ශුන්‍ය අනුප්‍රමාණය අදාළ වන බදු අයවන කාලසීමාවට වහාම පෙරාතුව වන බදු අයවන කාලසීමාව ආරම්භ වීමට පෙර අවසන් වන බදු අයවන කාලසීමාව තුළ මිලට ගත් භාණ්ඩ වල මුළු වටිනාකම අදහස් වේ.

(ii) "දේශීය සැපයුම්/ප්‍රභවයන් ගෙන් ප්‍රභවය වූ යෙදවුම්" යන්නෙන් ශුන්‍ය අනුප්‍රමාණය අදාළ වන බදු අයවන කාලසීමාවට වහාම පෙරාතුව වන බදු අයවන කාලසීමාව ආරම්භ වීමට පෙර අවසන් වන බදු අයවන කාලසීමාව තුළ දේශීයව නිෂ්පාදනය කළ කෘෂිකාර්මික, උද්‍යාන විද්‍යාත්මක, ධීවර, සත්ව පාලන හෝ කිරි නිෂ්පාදන සහ අවම වශයෙන් 10% ක දේශීය අගය එකතු කිරීමක් සහිත නිෂ්පාදන මිළදී ගැනීම සඳහා දරන ලද මුළු වියදම අදහස් වේ.

**ආපසු ගෙවීම සඳහා සුදුසුකම් ලබන තැනැත්තන්**

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ ලියාපදිංචි වී ඇති හෝටලයක්, අමුත්තන්ගේ ගෘහයක්, ආපනශාලාවක් මගින් සේවාවන් සපයන හෝ ඒ හා සමාන සේවාවන් සපයන සමාන ව්‍යාපාරයක නිරත, එකතු කළ අගය මත බදු සඳහා ලියාපදිංචි වී ඇති යම් තැනැත්තකු එකතු කළ අගය මත බදු ශුන්‍ය අනුප්‍රමාණය අයකිරීමට සුදුසුකම් ලබයි.

**ආපසු ගෙවීමට සුදුසුකම් ලබන එකතු කළ අගය මත යෙදවුම් බදු**

භාණ්ඩ හෝ සේවාවන් මිලදී ගැනීම හෝ භාණ්ඩ ආනයනය කිරීම මත 2019.12.01 දින හෝ එදිනෙන් පසුව ගෙවන ලද යෙදවුම් බදු සහ බදු අයවන කාලසීමාව සඳහා ඉල්ලා සිටින බදු බැර (ඉදිරියට ගෙන ආ එකතු කළ අගය මත යෙදවුම් බදු නොවන) ලියාපදිංචි තැනැත්තකු විසින් අනෙකුත් කොන්දේසි සපුරාලීමට යටත්ව "හෝටල් කර්මාන්තයෙන් සපයන සේවාවන්" යන පරිච්ඡේදයේ සඳහන් කර ඇති සේවාවන් සැපයීමට උපයෝජනය කර ඇති භාණ්ඩ හෝ සේවා ප්‍රමාණයට අදාළ යෙදවුම් බදු ආපසු ගෙවීමට සුදුසුකම් ලබයි.

**හෝටල් කාර්මාන්තයෙන් සපයන සේවාවන්**

හෝටල් සේවාවන් යන වර්ගීකරණය යටතට ගැනෙන හෝටලයක්, අමුත්තන්ගේ ගෘහයක් සහ ආපන ශාලාවක් හෝ වෙනත් ඒ හා සමාන ව්‍යාපාර මගින් සපයන සේවා වර්ග පහත සඳහන් වේ.

කාමර විකිණීම, A'la carte sales (වට්ටෝරුවකින් එක් පුද්ගලයෙකු විසින් කෑම වර්ග ඇණවුම් කිරීම) ඇතුළුව ආහාර විකිණීම, ආහාර බෙදා ගෙන කෑම (Buffet) සහ විවාහ උත්සව සඳහා ආහාර පාන යනාදිය සැපයීම (පිටතට ආහාර පාන සැපයීම හැර), ලොන්ඩරි සේවාව (හෝටලයෙන් අමුත්තන්ට ඒ සඳහා බිල්පතක් නිකුත් කර ඇත්නම් සහ ලොන්ඩරි සේවාව අදාළ හෝටලයේ බදු අය කළ හැකි සැපයුමේ කොටසක් ලෙස සලකන්නේ නම්), සම්මේලන ශාලා කුලියට දීම, ලොකර් විකිණීම (locker sales), දුරකතන, පිහිනුම් තටාක ටිකට්, ඡායා පිටපත් සඳහා අය කිරීම්, පාන වර්ග (පැකේජ හා අලෙවිසැල), මංගල උත්සව ශාලා කුලියට දීම, විවිධ විකුණුම් (ප්‍රදර්ශන, සජීවිකරණය, පාරිභෝගිකයින් ගෙන එන මත්පැන් සඳහා සේවා ලබා දීමේදී හෝටලය අය කරන ගාස්තුව යනාදිය), කොමිස් මුදල්, සේවා ගාස්තු, නේවාසික අමුත්තන් සඳහා සේවා සපයන්නේ නම් ඖෂධීය යෝග්‍යතාවය යනාදිය වැනි වෙනත් සියලුම සේවාවන්, නේවාසික අමුත්තන් සඳහා සපයන්නේ නම්.

එසේ වුවද, ඉහත සේවාවන් හැර හෝටල්, අමුත්තන්ගේ ගෘහයන් හා ආපනශාලා හෝ වෙනත් ඒ හා සමාන ව්‍යාපාර මගින් සපයන වෙනත් සේවාවන් ශුන්‍ය අනුප්‍රමාණය සඳහා සුදුසුකම් නොලබයි.

**සුදුසුකම් ලබන නිර්ණායක**

- එකතු කළ අගය මත බදු අනුප්‍රමාණය ශුන්‍ය ප්‍රතිශතය (0%) අදාළ වන, බදු අයවන කාලසීමාවෙහි එකතු කළ අගය මත යෙදවුම් බදු ආපසු ගෙවීම, එම ශුන්‍ය අනුප්‍රමාණය අදාළ වන බදු අයවන කාලසීමාවට වහාම පෙරාතුව වන බදු අයවන කාලසීමාව ආරම්භවීමට පෙර අවසන් වන බදු අයවන කාලසීමාව තුළ යෙදවුම් බදු සම්බන්ධයෙන් කොන්දේසි සපුරාලීම මත පදනම්ව තීරණය කළ යුතුය.

  ඒ අනුව උදාහරණයක් ලෙස, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියෙහි ලියාපදිංචි හෝටලයක් 2020.06.30 (2020) දිනෙන් අවසන් වන බදු අයවන කාලසීමාවෙහි යෙදවුම් සම්බන්ධයෙන් කොන්දේසි සපුරාලීම මත පදනම්ව, 2020.12.31 (2040) දිනෙන් අවසන් වන බදු අයවන කාලසීමාව සඳහා බදු අය කළ හැකි සැපයුම මත ශුන්‍ය අනුප්‍රමාණය අදාළ කර ගත හැකිය.

  එසේ වුවද, යම් තැනැත්තකු එම කාලසීමාව සඳහා 8% අනුප්‍රමාණයට එකතු කළ අගය මත බද්ද අය කර ඇත්නම්, එම බද්ද දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ගෙවිය යුතුය.

- 15% අනුප්‍රමාණයට එකතු කළ අගය මත බද්ද අයකර ඇති හා 2019.12.01 දින හෝ ඉන් පසුව බදු බැර ඉල්ලා සිටින (යෙදවුම් අයදුම් කිරීමට ලියාපදිංචි තැනැත්තාට පිළිවෙළින් මාස

12ක් හෝ මාස 24 ක කාලයක් ඇති නිසා) බදු ඉන්වොයිස් හෝ ආනයන රේගු ලිපි ලේඛන ආපසු ගෙවීමට සුදුසුකම් නොලබයි.

- 2019.12.01 දින හෝ එදිනෙන් පසුව එකතු කළ අගය මත බද්ද 8% ක අනුප්‍රමාණය ගෙවා ඇති යෙදවුම් බදු ආපසු ගෙවීමට සුදුසුකම් ලබයි.

**සපුරාලිය යුතු කොන්දේසි**

එකතු කළ අගය මත බදු ශුන්‍ය අනුපුමාණය (0%) අදාළ වන බදු අයවන කාලසීමාවට වහාම පෙරාතුව වන බදු අයවන කාලසීමාව ආරම්භවීමට පෙර අවසන් වන බදු අයවන කාලසීමාව තුළ ලියාපදිංචි තැනැත්තා විසින් මිලට ගත් භාණ්ඩවල මුළු වටිනාකමින් 60% කට නොඅඩු ප්‍රමාණයක්,

- දේශීයව නිෂ්පාදිත කෘෂිකාර්මික, උද්‍යාන විද්‍යාත්මක, ධීවර, සත්ව පාලන හෝ කිරි නිෂ්පාදන; හෝ

- අවම වශයෙන් 10% ක දේශීය අගය එකතු කිරීමක් සහිත දේශීයව නිෂ්පාදනය කළ ඕනෑම භාණ්ඩයක් මිල දී ගැනීමට දරා තිබිය යුතුය.

**ආපසු ගෙවීමට සුදුසුකම් ලැබීම පරීක්ෂා කිරීමේ සූත්‍රය**

එකතු කළ අගය මත බදු ශුන්‍ය අනුප්‍රමාණය අදාළ වන බදු අයවන කාලසීමාවට වහාම පෙරාතුව වන බදු අයවන කාලසීමාව ආරම්භවීමට පෙර අවසන් වන බදු අයවන කාලසීමාවේදී කරන ලද මිල දී ගැනීම්,

$$\frac{(A+B)}{C} \geq 60\%$$

වන්නේ නම්, ශුන්‍ය අනුප්‍රමාණය අදාළ වන කාලසීමාව සඳහා ආපසු ගෙවීම් සඳහා සුදුසුකම් ලබයි.

මෙහි ,

**A - දේශීයව නිෂ්පාදිත;**

- කෘෂිකාර්මික නිෂ්පාදන,
- උද්‍යාන විද්‍යාත්මක නිෂ්පාදන,
- ධීවර නිෂ්පාදන,
- සත්ව පාලන නිෂ්පාදන,
- කිරි නිෂ්පාදන,

**B - අවම වශයෙන් 10% ක දේශීය අගය එකතු කිරීමක් සහිතව නිෂ්පාදිත භාණ්ඩ**

- ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය කරන ලද භාණ්ඩ,
- කවර හෝ ක්‍රියාවලියක් මගින් ශ්‍රී ලංකාවේ දී එකලස් කරන ලද හෝ සම්බන්ධ කරන ලද භාණ්ඩ,

- ශ්‍රී ලංකාව තුළ විකිණීම සඳහා සකස් කරන ලද භාණ්ඩ,
- ශ්‍රී ලංකාවේ දී ඇසුරුම් කරන ලද භාණ්ඩ,
- ශ්‍රී ලංකාවේ දී බෝතල් කරන ලද භාණ්ඩ,
- ශ්‍රී ලංකාවේ දී පෙට්ටිවලට අසුරන ලද භාණ්ඩ,
- ශ්‍රී ලංකාවේ දී කැපීම, පිරිසිදු කිරීම හෝ පොලිෂ් කරන ලද භාණ්ඩ,
- ශ්‍රී ලංකාවේ දී ඔතන ලද හෝ ලේබල් කරන ලද භාණ්ඩ,
- ඉහතින් සඳහන් නොකළ වෙනත් යම් ආකාරයකින් ශ්‍රී ලංකාවේ දී විකිණීම සඳහා සකස් කරන ලද භාණ්ඩ. (තොග හෝ සිල්ලර ක්‍රියාවකදී නොවන. උදා - සීනි කිලෝ ග්‍රෑම් 1 ලෙස පැකට් කිරීම)

මෙම කාර්ය සඳහා, අදාළ නිෂ්පාදනයේ මිල, ආනයන පිරිවැයෙන් අවම 10% ලාභ තීරුව සමඟ වැඩිවීම පමණක්ම අගය එකතු කිරීම ලෙස නොසලකන අතර, ඉහත දක්වන ලද කුමන හෝ ආකාරයකින් අදාළ නිෂ්පාදනයේ භෞතික ස්වභාවය වෙනස් කිරීම මත සිදු වූ අගය එකතු කිරීමක් ඇතුළත් විය යුතුය.

### C - මිලට ගත් භාණ්ඩවල මුළු වටිනාකම

- A හා B යටතේ සඳහන් කර ඇති භාණ්ඩ
- ලියාපදිංචි තැනැත්තා විසින් සෘජුවම ආනයනය කරන ලද භාණ්ඩ
- දේශීයව මිලට ගත් ආනයනය කරන ලද භාණ්ඩ
- ප්‍රාග්ධන භාණ්ඩද ඇතුළුව භාණ්ඩ
- නිදහස් කරන ලද භාණ්ඩ

කෙසේ වෙතත්, පූර්ව කාලසීමාවක සිට ඉදිරියට එන ලද යෙදවුම් බදු වලට අදාළ භාණ්ඩ හෝ සේවා මිල දී ගැනීම හෝ භාණ්ඩ ආනයනය කිරීම සූත්‍රයෙහි කිසිම අවස්ථාවක දී නොසැලකිය යුතුය.

**ඔප්පු කිරීමේ කාර්යභාරය**

මිලදී ගත් භාණ්ඩ, දේශීයව නිෂ්පාදනය කරන ලද බව හෝ අවම 10% ක දේශීය එකතු කළ අගයක් සහිතව නිෂ්පාදනය කර ඇති බවට සනාථ කිරීම ලියාපදිංචි තැනැත්තාගේ වගකීම වේ.

ආපසු ගෙවීමේ විගණනය ආරම්භ කිරීමට පෙර, ආපසු ගෙවීම ඉල්ලා ඇති ලියාපදිංචි තැනැත්තාගෙන් ඇමුණුමේ සඳහන් කර ඇති පරිදි සකස් කරන ලද විස්තරාත්මක වාර්තාවක් ලබා ගත යුතුය.

**කොන්දේසි සපුරාලීමට අසමත් වීම**

එක් එක් ආපසු ගෙවීමේ ඉල්ලීම, විගණනය කළයුතු අතර අදාළ ඉල්ලීම පිළිබඳව සෑහීමකට පත් විය යුතුය. යම් අවස්ථාවක දී ලියාපදිංචි තැනැත්තකු විසින් ඉහත සඳහන් කළ කොන්දේසි සපුරා නොමැති බවට අනාවරණය වුවහොත්, ප්‍රකාශ කරන ලද සැපයුම එකතු කළ අගය මත බදු ඇතුළත්ව මිල අය කරන ලද බවට සලකා තක්සේරුව නිකුත් කළ යුතුය. එවැනි අවස්ථාවක දී යම් අතිරික්ත යෙදවුම් බද්දක් ඇත්නම් එය ආපසු ගෙවීමට සුදුසුකම් නොලබන අතර ඉදිරි කාලසීමාව සඳහා ඉදිරියට රැගෙන ගිය හැකිය.

**සරල කරන ලද එකතු කළ අගය මත බදු (SVAT) යෝජනා ක්‍රමය යටතේ ලියාපදිංචි කිරීම.**

හෝටලයක්, අමුත්තන්ගේ ගෘහයක්, ආපන ශාලාවක් මගින් සේවාවන් සැපයීම හෝ වෙනත් ඒ හා සමාන ව්‍යාපාරයකින් සමාන සේවාවන් සපයන සහ එම සැපයීම මත ශුන්‍ය අනුප්‍රමාණයට එකතු කළ අගය මත බද්ද අය කිරීමට සුදුසුකම් ලබන තැනැත්තකු, ශුන්‍ය අනුප්‍රමාණය අදාළවීම, එම අවස්ථාවේ කරුණු මත රඳා පවතින බැවින් සරල කරන ලද එකතු කළ අගය මත බදු යෝජනා ක්‍රමය (SVAT Scheme) යටතේ ලියාපදිංචි වීමට සුදුසුකම් නොලබයි.

දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්

ඇමුණුම

**හෝටල් කර්මාන්තයේ එකතු කළ අගය මත බද්ද ආපසු ගෙවීම සඳහා තොරතුරු**

1. ලියාපදිංචි තැනැත්තාගේ නම
2. බදුගෙවන්නා හැදින්වීමේ අංකය (TIN)
3. i. හෝටලය/අමුත්තන්ගේ ගෘහය/ආපනශාලා/සමාන ව්‍යාපාරයේ නම

   ii. ලිපිනය
4. i. ශ්‍රී ලංකා සංචාරක අධිකාරියේ (SLTDA) ලියාපදිංචිය

   ii. ආපසු ගෙවීම ඉල්ලා ඇති කාලසීමාව සඳහා SLTDA ලියාපදිංචියේ වලංගුභාවය
5. ආපසු ගෙවීම ඉල්ලා සිටින බදු අයවන කාලසීමාව
6. i. දේශීය සැපයුම්/ප්‍රභවයන්ගෙන් ප්‍රභවය වූ යෙදවුම්, මුළු වටිනාකමින් 60% වන බදු අයවන කාලසීමාව

   ii. 6.i අයිතමයෙහි සඳහන් කාලසීමාව සඳහා ආනයන හා මිලදී ගැනීමේ විස්තර

| අනුක්‍රමික අංකය | ආනයන/මිලදීගැනීම් විස්තර | VAT නිදහස් භාණ්ඩ/සේවා වල වටිනාකම | | VAT ගෙවීමට යටත් භාණ්ඩ/සේවා වල වටිනාකම | | ගෙවන ලද යෙදවුම් VAT මුදල | |
|---|---|---|---|---|---|---|---|
| 1 | ආනයනය කරන ලද භාණ්ඩ | 1.1 | | 1.2 | | 1.2.0 | |
| 2 | දේශීයව මිලදී ගත් භාණ්ඩ | 2.1 | | 2.2 | | 2.2.0 | |
| 2.1 | ආනයනය කළ භාණ්ඩ (දේශීයව මිලදී ගත්) | 2.1.1 | | 2.1.2 | | 2.1.2.0 | |
| 2.2 | දේශීය සාදන ලද භාණ්ඩ | 2.2.1 | | 2.2.2 | | 2.2.2.0 | |
| 2.3 | දේශීයව නිෂ්පාදනය කළ භාණ්ඩ | 2.3.1 | | 2.3.2 | | 2.3.2.0 | |
| 3 | උප එකතුව 1 හා 2 පේළිවල අදාල කොටුවල අගය එකතු කරන්න | 3.1 | | 3.2 | | 3.2.0 | |
| 4 | සේවා | 4.1 | | 4.2 | | 4.2.0 | |
| 5 | එකතුව (3 හා 4 පේළිවල අදාළ කොටු එකතු කරන්න) | | | | | | |

7. ආපසු ගෙවීමේ සුදුසුකම් ලැබීම පරීක්ෂා කිරීම

$$\frac{(A+B)}{C} \geq 60\%$$

මෙහි,

A = {2.2.1 හා 2.2.2 කොටු වල මුළු එකතුව}

B = {2.3.1 හා 2.3.2 කොටු වල මුළු එකතුව}

C = {3.1 හා 3.2 කොටු වල මුළු එකතුව}

මාගේ දැනුමේ හැටියට මෙම ප්‍රකාශනයෙහි මා විසින් සපයන ලද තොරතුරු නිවැරදි හා සත්‍ය බව මම මෙමගින් ප්‍රකාශ කර සිටිමි.

ප්‍රකාශකගේ නම:

ප්‍රකාශකගේ තනතුර: කළමනාකාර අධ්‍යක්ෂ/ප්‍රමුඛ හවුල්කරු/අයිතිකරු

අත්සන:

දිනය: